ඇසීමෙන් යාපනයේ නීතිගරුක මිනිසුන් ප්‍රීති වූහ. ආවා පාතාල කල්ලිය මට්ටු කිරීමට පොලිසිය ගන්නා උත්සාහයට යාපනයේ ජනතාව ලබාදී තිබුණේ විශාල සහයෝගයකි.

ආවා කල්ලිය ධනුරොක්ස් කල්ලිය මෙන්ම යාපනයේ ක්‍රියාත්මක වන තවත් පාතාල කල්ලි පිළිබඳව පොලිසියට නිරතුරුවම තොරතුරු ලබා දෙන්නට යාපනයේ ජනතාව පෙළඹී සිටී. ඔවුන් ඒ තත්ත්වයට පත්ව සිටින්නේ මේ පාතාල මැරයන් අතින් තමන්ට දිගින් දිගටම සිදුවන අකටයුතු කම් නිසාය.

යාපනය අර්ධද්වීපය පුරා බිහිවෙමින් තිබෙන කුඩා පාතාල කණ්ඩායම් නිසා යාපනයේ අහිංසක ජනතාව පත්ව ඇත්තේ දැඩි අපහසුතාවකටය. යාපනය අර්ධද්වීපය තුළ ක්‍රියාත්මක වන මේ මදාවි පාතාල කණ්ඩායම්වල ක්‍රියාකාරකම් නිසා අහිංසක ජනතාව ජීවත් වන්නේ දැඩි පීඩනයකින් යුතුවය. අහිංසක ජනතාව පත්ව ඇති ඒ අසරණකම තේරුම් ගෙන සිටින පොලිසිය මේ පාතාල මැර කණ්ඩායම් මට්ටු කිරීමට විශාල වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

උතුරු පළාත භාර ජ්‍යෂ්ඨ නියෝජ්‍යපොලිස්පති රවී සෙනෙවිරත්න, නියෝජ්‍ය පොලිස්පති රාජිත ශ්‍රී දමින්ද, පොලිස් අධිකාරී නිහාල් තල්දුව, සහකාර පොලිස් අධිකාරී රෝහණ ගමගේ මහත්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ යාපනය අර්ධද්වීපය පුරා විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර හමාරය.

යාපනය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසාද් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් යාපනය කොට්ඨාසයේ සියලුම පොලිස් ස්ථාන මේ ආරක්ෂක වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීමට සැදී පැහැදී සිටිති.

යාපනය පොලිස් කොට්ඨාසය පුරා හදිසි මාර් බාධක යොදා සැකකටයුතු පුද්ගලයන් පරීක්ෂාව බුද්ධි අංශ ශක්තිමත් කර මේ පාතාල කල්ලිවලට සම්බන්ධ පුද්ගලයන් පිළිබඳව මෙන්ම ඔවුන් ගනුදෙනු කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීම ආරම්භ කර ඇත.

එමෙන්ම මේ පාතාල කල්ලිවලට සම්බන්ධ පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන් පොලිසිය වෙත කැඳවා තම දරුවන් මෙවැනි කල්ලිවලට සම්බන්ධ වී සිටීමේ ආදීනව පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක්ද පොලිසිය ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටියි.

යාපනය අර්ධද්වීපය පුරා මේ කුඩා පාතාල කල්ලි බිහිවන්නේ 2009 වර්ෂයේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය සහමුලින්ම මර්දනය කිරීමෙන් පසුවය.

ආවා ගෲප් කල්ලිය බිහිකිරීම සඳහා එදා ආරක්ෂක අංශවල ඉහළ නිලධාරීන්ගේද සහාය ලැබුණු බවට චෝදනා එල්ල වී තිබෙයි.

එල්.ටී.ටී.ඊ. සංවිධානය බිඳවැටීමෙන් පසු සැඟව සිටින ත්‍රස්තවාදීන් විනාශ කර දැමීමට ආවා පාතාල කල්ලිය බිහිකළ බවට මේ ආරක්ෂක අංශ ප්‍රධානීන් වෙත චෝදනා එල්ල වී තිබුණේය.

එමෙන්ම යාපනයේ තවමත් අනාරක්ෂිත තත්ත්වයක් තිබෙන බවට ඒත්තු ගැන්වීමටත් සාමාන්‍ය ජනතාව තුළ කිසියම් භීතියක් ඇතිකරලීමේ යටි අරමුණුවලින් මෙම පාතාල කල්ලිය පෝෂණය කළ බවට ද බරපතළ අන්දමේ චෝදනා එවකට ආරක්ෂක අංශවල ඇතැම් උසස් නිලධාරීන් වෙත එල්ල වී තිබුණේය.

එදා යාපනයේ බිහිවූ ‘ආවා ගෲප්’ කල්ලියට අමතරව මේ වන විට ‘සීෆෝ ගෲප්’, ‘ධනුරොක්ස් ගෲප්’ ඇතුළු තවත් පාතාල කල්ලි හත අටක්ම බිහිව තිබෙයි.

මේ පාතාල කල්ලිවල සාමාජිකයන් සියලූ දෙනාම පාහේ අවුරුදු 17 ත් 25 ත් අතර වයස් සීමාවල පසුවන ලාබාල තරුණයන්ය. මොවුන්ගෙන් බොහෝ දෙනෙකු අපොස සාමාන්‍ය පෙළ උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන්ය.

යාපනය අර්ධද්වීපය පුරා බිහිවී ඇති මේ කුඩා පාතාල කල්ලි බිහිවීමට අඩිතාලම වැටෙන්නේ පාසල් අවධියේ සිටය. පාසල්වල චණ්ඩින්ගෙන් සමන්විත කණ්ඩායම් බිහිව තිබෙයි. පාසල හැර යෑමෙන් පසු මේ චණ්ඩින්ගෙන් සමන්විත කණ්ඩායම් පාතාල කල්ලි බවට පරිවර්තනය වී ඇති බව පොලිසිය කළ විමර්ශනවලින් අනාවරණය වී තිබේ.

මේ වන විට යාපනයේ තරුණයන් වර්තමානයේ නවීන තාක්ෂණික ක්‍රමෝපායන් මෙන්ම සන්නිවේදනයන් දැඩිව ග්‍රහණය කරගෙන සිටිති. මෙහි බහුතරයක් තරුණ තරුණයන් සමාජ ජාලා වෙබ් අඩවි පවත්වාගෙන යෑම මෙන්ම දකුණු ඉන්දියාවේ සිට කේබල් ටී.වී. හරහා එන සියලූම කසිකබල් දෙමළ චිත්‍රපට නැරඹීමට පෙළඹී සිටිති.

මේ චිත්‍රපටවල වැඩි ප්‍රමාණයක් ඇත්තේ තියුණු ආයුධවලින් කපා කොටා ගැනීම්ය. පාතාල කල්ලි කේන්ද්‍රකර ගත් සටන්ය. පොලිසියට එරෙහිව සටන් කරන පාතාල කල්ලි පිළිබඳ චිත්‍රපටය. මේ සියල්ල නරඹන යාපනයේ බහුතරයක් තරුණ තරුණියන් සමාජයට එන්නේ ඒ සැලෝලයිට් පටවල සිටින පුහු වීරයන් ලෙසය. ඔවුන් අනුකරණය කරන්නේ ඒ චිත්‍රපටවල වීර ක්‍රියාවන්ය.

මේ වන විට යාපනයේ බිහිව තිබෙන පාතාල කල්ලි බොහොමයක් ක්‍රියා කරන්නේ ඉන්දියාවේ නිෂ්පාදනය වන මේ දෙමළ චිත්‍රපටවලට අනුරූපවය.

යාපනයේ තරුණ තරුණියන් බහුතරයක් අද සිටින්නේ විරැකියාවෙන්ය. පාසලෙන් හොඳ අධ්‍යාපනයක් ලබන තරුණ තරුණියන් එක්කෝ විශ්වවිද්‍යාලවලට ඇතුළුව වැඩිදුර අධ්‍යාපනය ලබති. නැත්නම් හොඳ අධ්‍යාපනයක් ලැබූවන් විදේශ රටවල රැකියාවල් සඳහා පිටව යයි.

මේ දෙකටම නැති බහුතරයක් තරුණ තරුණියන් අද සිටින්නේ නන්නත්තාර තත්ත්වයකය.

යාපනය අර්ධද්වීපය පුරා ඇත්තේ කෘෂිකාර්මික ආර්ථික රටාවකි. යාපනයේ ඇති දැඩි අව් රශ්මිය සමග සටන් කරමින් කෘෂිකර්මාන්තය කිරීම පහසු කටයුත්තක් නොවන්නේය. එය සැබැවින්ම ඉතාම කර්කශ වූ ක්‍රියාවලියකි.

වර්තමාන තරුණ පරපුර කර්කශ කෘෂිකර්මාන්තයට එක්වීමට දක්වන්නේ දැඩි අකමැත්තකි. වර්තමාන තරුණ පරපුර කෘෂිකර්මාන්තයෙන් ඈත්වෙමින් සිටිති. අන්තර්ජාලයේ සැරිසැරීම සමාජ ජාලා වෙබ් අඩවි පරිහරණය කිරීම දමිළ චිත්‍රපට නැරඹීමට දැඩි ලොල් බවක් දක්වන මේ තරුණ පිරිස් මේ කාර්යයන් සඳහා දවසේ වැඩි කාලයක් වැය කරති.

පාතාල මැර කණ්ඩායම් බිහිකරගෙන ඒ හරහා විවිධ ආදායම් මාර්ග ගොඩනඟා ගැනීමට මේ තරුණ පිරිස් උත්සාහ දරමින් සිටිති. යාපනයේ විරැකියාවෙන් පෙළෙන රස්තියාදුකාර තරුණයන් මේ පාතාල කල්ලිවලට සම්බන්ධ වන්නේ ඒ නිසාය.

එමෙන්ම චණ්ඩි පාර්ටි දැමීම තරුණියන්ගේ ආකර්ෂණය තමන් වෙත ලබා ගැනීම වැනි පහත් මට්ටමේ ආශාවන්ගෙන්ද මේ තරුණයන් පෝෂණය වී සිටිති.

‘ආවා ගෲප්’ පාතාල කල්ලිය බිහිවන්නේ 2011 වර්ෂයේදීය. එහි මුල්ම සාමාජිකයන් ගණන 20 කි. ආවා කල්ලියේ මුල්ම නායකයා වූයේ කුමරේෂන් රත්නම් විනෝදන්ය. මොහු යාපනය අර්ධද්වීපයේ පෙනී සිටියේ ආවා යන අන්වර්ථ නාමයෙන්ය. යාපනය චුන්නාකම් ඉලූවිල් ප්‍රදේශයේ පදිංචිකරුවකු වූ ආවා කුඩා කලසිටම දඩබ්බරයෙකි.

කුමරේෂන් රත්නම් විනෝදන් ඉනුවිල් ප්‍රදේශයේ ශරීර අභ්‍යාස ව්‍යායාම් කිරීම සඳහා ජිම් එකක් පවත්වාගෙන ගියේය. ආවා කල්ලියට සම්බන්ධ වී සිටි ලාබාල තරුණයන් එක්රැස් වුණේ මේ ජිම් එක පිහිටි ගොඩනැඟිල්ලේය.

මේ කල්ලියේ වැඩි දෙනෙකු කායවර්ධන ව්‍යායාම් කර ඇඟපත පුම්බා ගත් උන්ය. ඇතැම් ආවා කල්ලි සාමාජිකයන් අතපයවල පච්චා කොටා ගෙන සිටියහ. අමුතු තලයේ කොණ්ඩා මෝස්තරවලින් සැරසී සිටියහ. මේ මැරයන් පෙනුණේ දකුණු ඉන්දියාවේ කසිකබල් දෙමළ චිත්‍රපටවල රඟන සැලෝලයිට් මැරයන් යාපනය අර්ධද්වීපයේ ජීවමානව සිටින ලෙසය.

ආවා පාතාල කල්ලියේ මැරයන් පාවිච්චි කළේ අමුතුම ආකාරයේ යතුරුපැදිය. ඒ යතුරුපැදිවලට සවිලන හෝන් එකක් සහ විදුලි පහන්ද සවි කර තිබුණේය.

ආවා කල්ලියේ මැරයන් එදා පාරට බැස්සේ කඩු පොලූවලින් සන්නද්ධවය. යතුරුපැදිවල හෙඩ් ලයිට් දල්වාගෙන නගරය දෙවනත් වන ලෙස හෝන් ගසමින් මොවුන් යාපනය නගරය පුරා සැරිසැරුවෝය.

යාපනයේ හෝටල්වලින් නොමිලේ ආහාර ගැනීමට මත්පැන්හල් වලින් නොමිලේ මත්පැන් ලබා ගැනීමට ආවා කල්ලියේ සාමාජිකයන් කටයුතු කළහ. මේ ක්‍රියාවන්ට විරුද්ධ වූවන්ට කඩුපොලූවලින් සංග්‍රහ ලැබෙන නිසා කිසිවකුත් ඊට එරෙහි වුණේ නැත.

තමන් සිත්ගත් තරුණියන් හොඳින් හෝ නරකින් ලබා ගැනීමට එදා ආවා කල්ලියේ සාමාජිකයන් කටයුතු කළහ. ආවා කල්ලියේ වීරයා වී සිටියේ එල්.ටී.ටී.ඊ. නායක වේලූපිල්ලේ ප්‍රභාකරන්ය. මේ පාතාල සාමාජිකයන් ජංගම දුරකථනවල මුහුණතේ තිබුණේ ප්‍රභාකරන්ගේ ඡායාරූපය. මොවුන් ඒ තරමට ප්‍රභාකරන්ට ගෞරව කළහ. එහෙත් යාපනය අර්ධද්වීපයේ සාමාන්‍ය ජනතාවට මේ මැරයන් වහ කදුරු මෙන් විය. මොවුන්ට එරෙහිව ප්‍රසිද්ධියේ කිසිවක් නොකීමද අප්‍රසිද්ධියේ යාපනයේ ජනතාව මේ මැරයන් දැඩි ලෙස විවේචනය කළහ.

එදා ආවා කල්ලියේ සිටි මැරයන් අතර ඩන්රෝ, සෙන්දුරන්, කන්නා, දේවා ප්‍රකාශ් වැන්නවුන් ප්‍රබලයන් බවට පත්ව සිටියහ. මේ මැරයන් හැම එකාම සිටියේ යුද මානසිකත්වයෙන්ය. මොවුන් එදා යාපනයේ පොලිස් නිලධාරීන්ට පවා අභියෝග කළහ.

දෙමළ ඩයස්පෝරාවට ද එදා අවශ්‍ය වී තිබුණේ ‘ආවා කල්ලියී හරහා යාපනය අර්ධද්වීපයේ භීෂණයක් පතුරුවා හැරීමටය. යාපනය අනාරක්ෂිත තත්ත්වයට පත්කිරීම හරහා තමන්ගේ අරමුදල් ශක්තිය වැඩිකර ගැනීමට විදේශ රටවල සිට ක්‍රියාත්මක වූ දෙමළ ඩයස්පෝරාවේ අරමුණ වී තිබුණේය.

එහෙත් ආවා කල්ලියට එරෙහිව පොලිසිය දැඩි ක්‍රියාපිළිවෙතක් අනුගමනය කළහ. ආවා කල්ලියේ නායකයන් ඇතුළු බුරුතු පිටින් පාතාල සඟයන් පොලිස් අත්අඩංගුවට පත්වූහ.

ආවා කල්ලිය මුල් වකවානුවේ යාපනය අර්ධද්වීපයේ විශාල භීෂණයක් ගොඩනඟාගෙන සිටියද වර්තමානය වන විට එහි තත්ත්වය කෙමින් කෙමින් දියාරු වෙමින් තිබේ.

ආවා කල්ලියට එරෙහිව පොලිසිය මෙන්ම ආරක්ෂක අංශ දැඩි ක්‍රියාමාර්ග ගැනීම නිසා මොවුන් තරමක පසුබෑමකට ලක්ව සිටිති.

යාපනයේ සාමාන්‍ය ජනතාව මේ පාතාල කණ්ඩායම් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරති. යාපනයේ බහුතරයක් සාමාන්‍ය ජනතාවට අවශ්‍ය වී ඇත්තේ නිදහසේ සාමකාමීව ජීවත් වීම පමණය.

විනෝදන් ආවා කල්ලියට නායකත්වය දුන් කාල සීමාවේ මොවුන් ඉතාම ප්‍රබල තත්ත්වයක සිටියද පසු කලෙකදී මේ කල්ලිය දුර්වල වන්නට පටන් ගත්තේය. ආවා කල්ලියේ ප්‍රබලයකුව සිටි දේවා ඉන්දියාවට පලා ගියේය. කන්නා හොර රහසේම ප්‍රංශයේ පදිංචියට ගොස් තිබුණේය. විනෝදන්ට ආවා කල්ලිය එපා වුණේය.

මීට වසර තුන හතරකට උඩදී ආවා කල්ලිය දෙකඩ වුණේය. ඒ නායකත්වය සම්බන්ධයෙන් ඇතිවූ ආරවුල් මතය. ආවා කල්ලියේ නායකත්වය ලබා ගැනීම සඳහා ධනු නමැති මැරයා සිහින මැව්වේය. එහෙත් කල්ලියේ බහුතරයක් දෙනා ධනු නායකත්වයට පත්කිරීමට කැමැත්ත පළ කළේ නැත.

26 වන පිටට




මම දන්න හැටියට ස ප්‍රේමදාස ඕ ලෙවල් විභාග වත් පාස් කරල නෑ. එයා පාස් කරල තියෙනවනං පුලුවන්නං ගෙනල්ල පෙන්නන්න
**රවී කරුණානායක**

මේ රටේ මහා ආර්ථික විප්ලවයක් කරපු රට ගොඩ ගත්ත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉගෙනගෙන තිබුනේ 8 පන්තියට විතරයි. ඒ උනාට එතුමිය රට ගොඩනගන්න මොනතරම් විප්ලවයක් කළා ද?
**අබරන්**